# 18. පැරණි හිතවතා

ධූම කේතුව ගවේෂණය කිරීම මේ වන විටත් ඇරඹී තිබුණි. රාත්‍රී මෙන්ම දිවා පැත්තටත් විද්‍යාඥයන් පස් දෙනා බැගින් ගෙන ගිය, ජැස්මින් යානය, ගුරුත්වය රහිත පරිසරයක ක්‍රියාකිරීමට විශේෂයෙන්ම නිපදවන ලද්දකි. එය ඩිස්කවරි යුගයේ භාවිතයට ගත් කුඩා යානා මෙන් නොව කුඩා අභ්‍යවකාශ යානයක්ම වූයේය.

හැලී මත අනතුරක් නැති බව සැක හැර දැනගත් කපිතාන් ස්මිත්, යුනිවර්ස් යානය කිලෝමීටර ගණනාවක් ඈතට ගෙන ගොස් හිරු උදාව හා බැස යෑම දැකිය හැකි ප්‍රදේශයක නැවැත්වීය.

හිරු උදාවත් සමග, හැලී මත තිබූ සමහර ආවාට වලින් වාෂ්ප පිටවීම ආරම්භ විය. ගමන් මග වෙනස් කිරීමට සුළහක් නොවූ බැවින් ඒවා ගමන් කළේ ඉතා අස්වාභාවික ලෙස කෙලින්මයි. මේවායේ සමහර විටක දක්නට තිබූ වර්ණය නිසා ඒවා ජීවයේ ලක්ෂණයක් වන ඇල්ගී වගාවක් ලෙස සමහර ජීව විද්‍යාඥයෝ සැලකූහ.

විද්‍යාඥයින් කණ්ඩායම මෙම වාෂ්ප පිටවන ආවාටයන් පරීක්ෂාවට ලක් කළේ එට්නා හෝ විසූවියස් ගිනි කන්ද පරීක්ෂා කරන්නාක් මෙනි. නමුත් මේවායේ ගිනි කන්දක තරම් දරුණු බවක් නොවීය. අනිත් අතට මෙසේ පිටවන ජලයෙන් වැඩි කොටසක් ආපසු හැලී මතට වැටුනේත් නැත.

බොහෝ වේලාවක් තර්ක කිරීමෙන් පසු දිවා පැත්තේ වූ විශාලම ආවාටය අසලට යුනිවර්ස් ගෙන යෑමට ස්මිත් එකඟ විය. එහි කුඩා විවරයෙන් සුදු මීදුම් ධාරාවන් නිකුත් වූ ආකාරය ඉතා මනස්කාන්ත දර්ශනයකි. ඒ වටා තිබූ වර්ණවත් ඛනිජ වර්ග රාශියක් එකතු කර ගැනීමට විද්‍යාඥයින් යුහුසුලු වන බව පෙනුණි.

මෙම ආවාටයට, මදක් ඈතින්, කිසිවෙක් බලාපොරොත්තු නොවූ ආකාරයේ, සංසිද්ධියක් දක්නට තිබුණි. මුලින්ම එය දුටු විද්‍යාඥයින් තමන් දකින දෙය විශ්වාස කළේ නැත. හැලී ගේ මතුපිට හෙක්ටයාර ගණනාවක් පුරා දක්නට ලැබුණේ සාමාන්‍ය වැවකි. එකම වෙනස එහි වූ කලු පැහැයයි.

වැවේ ඇත්තේ ජලය විය නොහැකියි. මෙවැනි පරිසරයක ස්ථායි ලෙස පැවතිය හැක්කේ තෙල් හෝ තාර වැනි ද්‍රව්‍ය වලට පමණි. මෙම වැව මත, බිමක් මතුපිට මෙන්, ඇවිදිය හැකි බව සොයා ගැනීමත් සමග එය ගවේෂක කණ්ඩායමේ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානය බවට පත්වුයේය. මෙයට හේතුව මතුපිට පටලයේ වූ ඇලෙන සුළු බවයි.

එහි ප්‍රතිපලය වුයේ වා අගුලේ ඇතුළත බිත්තියේත් බොහෝ තාර පැල්ලම් දක්නට ලැබීමයි. මෙයින් ඉතා කෝපයට පත් කපිතාන්වරයා ඉන්පසු වැවේ ඇවිදීම සම්පූර්ණයෙන්ම තහනම් කළේය.

# 19. දාමයේ කෙලවර



හැම කෙනෙක්ම, හැම දෙයක්ම දන්නා හුරු පුරුදු පරිසරයකදී, අමුත්තෙකු හමුවීම තරම් පුදුමයක් නැත. හේවුඩ් ෆොලොයිඩ්ට මෙම අමුත්තා හමු වුයේ යානයේ කොරිඩෝව දිගේ පාවී යද්දීයි. මෙතරම් කලක් කිසිවෙකුට අසුනොවී මොහු සිටියේ කෙසේද යන්න ෆොලොයිඩ් ගේ සිතට ආ පළමු වැනි ප්‍රශ්නයයි. නමුත් අමුත්තා ෆොලොයිඩ් දෙස බැලුවේ දුෂ්කර අවස්ථාවකට පත්වූ කෙනෙක් මෙනි. අවසානයේ ඔහු හඳුනා ගැනීමට ෆොලොයිඩ් සමත් විය.

"මේ වික්ටර් නේ. මට හඳුනාගන්න බැරිවුනා. එහෙනම් විද්‍යාව වෙනුවෙන් ඔබ ලොකු පරිත්‍යාගයක් කළා."

"ඔව්, මම අන්තිමේදි හෙල්මට් එකක් ඇතුළට ඔලුව දා ගත්තත්, රැවුල් කෑලි නිසා කියන කිසිම දෙයක් ඇහුනේ නැහැ."

1986 දී ධූම කේතුව වෙත යවන ලද පරීක්ෂා උපකරණ වලින් සොයාගෙන තිබුණේ එහි ඝනත්වය ජලයට වඩා අඩු බවයි. මේ අනුව ධූම කේතුව එක්කෝ ඉතා සවිවර ද්‍රව්‍යයකින් සෑදී ඇතැයි හෝ එසේ නැත්නම් කුහර විශාල සංඛ්‍යාවකින් සමන්විත යයි තීරණය කරන ලදි. මෙම මත දෙකම සත්‍ය විය.

ගුහා ගවේෂණය කිරීම කපිතාන් ස්මිත් මුලදී සම්පූර්ණයෙන්ම තහනම් කළේය. නමුත් ආචාර්ය චාන්ට් මේ පිළිබඳව විශේෂඥයෙක් බවත්, ඔහු මේ ගමනට සහභාගි කරවා ගන්නා ලද්දේ මේ සඳහාම බවත් පෙන්වා දීමෙන් පසුව, අවසානයේ කපිතාන් එකඟ කරවා ගැනීමට හැකි වුයේය.

"මෙම ගුරුත්වයේදී ගුහාවක් කඩා වැටෙන්නේ නැහැ. එම නිසා ගුහාවක් තුළ හිරවෙන්න විදියක් නැහැ."

"එතකොට යානය සමග සම්බන්ධය?"

"ඔහු අතේ ඇති සම්බන්ධතා කම්බියේ ප්‍රකාශ තන්තුවක් තිබෙන නිසා, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ."

"එයත් එක්ක වෙන කවුද යන්නේ?"

"ක්ල්ෆ් ට කියන්න, අපට එයා බොහොම වටිනා බව. එයාට යන්න පුලුවන් ගුහාවේ කට පෙනෙන තරම් දුර විතරයි. චාන්ට් එක්ක සම්බන්ධය නැතිවුනොත් මගේ අවසරයක් නැතිව හොයන්න යන්න එපා."

තමා, ක්ලිෆ් ග්‍රීන්බර්ග් ට සම්බන්ධ කරන කම්බියේ එක් කෙලවරක් අතැතිව ගුහාව ඇතුළට ගිය චාන්ට් තමා

සිටින්නේ පොලොවේ නගර තරම් වත් පැරණි නැති ස්ථානයක බව එකවර අවබෝධ විය.

ඔහු ගමන් කරමින් සිටියේ මීටර හතරක පමණ විෂ්කම්භයක් සහිත උමඟක් තුළිනි.

"දැන් ඔබව පේන්නේ නැහැ" කීවේ උමං දොරටුවේ සිට මීටර පණහක් පමණ උමග තුළට ගමන් කර සිටි ග්‍රීන්බර්ග්ය.

"ගුවන් විදුලි පරිපථය හොඳයි. මොනවද පෙනෙන්නේ?"

"මේක විස්තර කරන්න මට වචන නැහැ. ඇතුලෙ තියෙන්නේ පාෂාණ නොවෙයි. අත තිබ්බ ගමන් කැඩෙන ජාතියක්."

"ඒ කියන්නේ ජීව ද්‍රව්‍යයක්ද?"

"නැහැ. කාබනික ද්‍රව්‍යයක්. ජීවයට හොඳ අමුද්‍රව්‍යයක්. තාම මාව පේනවද?"

"නැහැ විදුලි ලාම්පුවේ ආලෝකය නම් පේනෙනවා."

"මෙන්න මේක ඇතුලෙ ලොකු කුහරයක්. ඒක හිස් ගෝලයක් වගේයි. ඒකෙ ඇතුළේ තියෙන්නේ ඉටි වගේ ජාතියක්."

මේ අතර දකින සෑම ඛනිජ වර්ගයකම කොටස් එකතු කර ගැනීමට චාන්ට් අමතක කලේ නැත.

"කම්බිය තව කොච්චර දිග තියෙනවාද?"

"කිලොමීටර භාගයක් විතර තියෙනවා."

හිමිදිරියේ දක්නට ලැබෙන මුල් ආලෝකය වැනි දුර්වල දීප්තියක් ඔහු ඇතිත් දුටුවේ මේ අවස්ථාවේයි. අඳුරට ඇස් හුරු වීමත් සමග එහි දීප්තිය වැඩිවන බව හැඟුණි. එහි තරමක කොළ පැහැයක් ද ඇති බව පෙනෙන්ට විය.

"මොකද වෙන්නේ?" කියා ඇසුවේ ග්‍රීන්බර්ග් ය.

"නැහැ මොකුත් නැහැ. මම මෙහෙ තියෙන ඒවා නිරීක්ෂණය කරනවා."

මෙවැන්නකට හේතු ගණනාවක් තිබිය හැකිය. සූර්යාලෝකය ස්වභාවික සිදුරක් තුළින් ගලා ඒම පළමුවැන්නයි. නමුත් මෙතරම් යටට සූර්යාලෝකය එතැයි සිතිය හැකි නොවේ. විකිරණශීලිතාව මෙයට හේතුවක් විය හැකි නමුත්, එවැන්නක් ඇද්දැයි සොයා ගත හැකි උපකරණයක් ඔහු අත නොතිබුණි. යම්කිසි ස්ඵුර දීප්ත ඛනිජයක් නිසාද මෙවැන්නක් ඇති විය හැක. අනිත් හේතුව විය හැක්කේ, ජෛව දීප්ත ජීවියෙක් වුවද හැලී ගේ ධූම කේතුව මත එවැන්නක් පරිණාමය වන්නට ඉඩක් ඇද්ද?

කෙසේ වෙතත් අනිත් කුහරය දිගේ ගොස් එය වඩා හොඳින් පරීක්ෂා කළ යුතු බව චාන්ට් තීරණය කළේය. ඒ බව ග්‍රීන්බර්ග්ට දැන්වූවද, ඔහුගෙන් පිළිතුරක් ලැබුණේ නැත.

"ක්ලිෆ් මාව ඇහෙනවද? මම අනිත් උමග දිගේ යන්නයි හදන්නේ."

එවර ග්‍රීන්බර්ග් ගේ පිළිතුර වහාම ලැබුණි.

"බොහොම කණගාටුයි බිල්. ඉක්මනට ආපහු එන්න. හදිසි තත්වයක් ඇතිවෙලා. අපට වහාම ආපහු පොළොවට යන්න වෙලා වගෙයි."

චාන්ට් ට කිසිදාක ඒ දීප්තිමත් ආලෝකය කුමක් දැයි සොයා ගත හැකි වූයේ නැත.

ඊළඟ දින කීපය තුල සිදුවූ දේ නිසා, එයට සිත යොමු කළ නොහැකිවුවත්, ඔහුට කිසිදාක එය අමතක නොවනු ඇත. ඊළඟ ගවේෂණ කණ්ඩායමට මේ පිළිබඳව ලියූ සටහනක් එහි තබා ආ බව බිල් චාන්ට් කිසිවෙකුට කීවේ නැත.

## 20 ආපසු කැඳවීම

ෆොලොයිඩ් කපිතාන් ගේ කාමරයට යන විට ස්මිත් සිටියේ කිසිවක් කර කියා ගත නොහැකි තත්වයකයි. මෙය යුනිවර්ස් හා සම්බන්ධ දෙයක් වූයේ නම් මේ වන විට ඔහු දිගට හරහට අණ දෙමින් යානය හසුරුවනු නොඅනුමානයි. නමුත් දැන් ඔහුට කළ හැකි එකම දෙය වුයේ, පොළොවෙන් ඊළඟ පණිවුඩය ලැබෙන තෙක් බලාසිටීම පමණි.

කපිතාන් ලැප්ලෙස් ඔහුගේ පැරණි මිතුරෙකි. ඔහු මෙවැනි තත්වයකට පත් වූයේ, කෙසේදැයි කිසිවෙක් නොදනී. යුනිවර්ස් යානයට, ඔහුට උපකාර කළ හැක්කේ එකම ආකාරයකින් පමණක් බව ස්මිත් ගේ අදහස විය. මෙහෙයුම් මධ්‍යස්ථානයටද කළ යුත්තේ කුමක්ද යන්න ගැන පැහැදිලි අදහසක් ඇති බවක් නොපෙනුණි. මෙය අභ්‍යවකාශයේ විටින් විට සිදුවන, අවසාන පණිවුඩ හා ශෝක ප්‍රකාශ සම්ප්‍රේෂණය කිරීම හැර වෙන කිසිවක් කළ නොහැකි තත්වයක් ලෙස පෙනුණි.

"අනතුරක් සිදුවෙලා තියෙනවා. අපට වහාම පොළොවට ආපහු එන්න කියා තියෙනවා. ඒ ගොල්ලො බේරාගන්න පුළුවන්ද බලන්න."

"මොකක් ද අනතුර ?"

"අපේ අනිත් යානය ගැලෙක්සි, බ්‍රහස්පතිගේ චන්ද්‍රිකා අතර හිරවෙලා."

ෆොලොයිඩ් එය විශ්වාස නොකරන බව ඔහුගේ මුහුණෙන් පෙනුණි.

"මම දන්නවා මේක වෙන්න බැරි දෙයක් බව, නමුත් ගැලෙක්සි තියෙන්නේ යුරෝපා උඩ."

"යුරෝපා ?"

"ඔව් යානය කැඩිලා. ජීවිතවලට නම් අනතුරක් වී නැහැ. විස්තර තවම ලැබුණේ නැහැ."

"කවදද මේක වෙලා තියෙන්නේ ?"

"පැය දොළහකට විතර කලින්."

"නමුත් අපට කරන්න පුළුවන් මොකක් ද? අපි ඉන්නේ සූර්යග්‍රහ මණ්ඩලයේ අනිත් පැත්තේ. චන්ද්‍ර කක්ෂයකට ගිහින් ඉන්ධන ලබාගෙන ආපසු, බ්‍රහස්පති වෙතට එන්න, මාස ගණනක් යාවි."

"මම ඒක දන්නවා. නමුත් ඒකවත් කරන්න තියෙන එකම යානය මේක විතරයි."

ෆොලොයිඩ් ගේ සිත යොමු වුයේ මෙම පුවතේ ඇති වැදගත්කම ගැනයි. අඩ සියවසක කාලයක් තුළ පළමු වැනි වරට හා ඉතිහාසයේ දෙවැනි වරට, අභ්‍යවකාශ යානයක් තහනම් චන්ද්‍රයා මතට ගෙනවිත් තිබේ.

"ඔබ හිතනවාද යුරෝපා වල ඉන්න හෝ තියෙන දෙයක් මේකට හේතු වුනයි කියා."

"මමත් ඒක ගැන හිතුවා. නමුත් අපිත් යුරෝපා වටා ගිහින් නොයෙක් දේ කළත්, මොකුත් උනේ නැහැ."

"අනිත් කරුණ අපි ඒ ගොල්ල බේරා ගන්න ගිහින් අපටත් මොකුත් වුනොත් ?"

"ඒක තමයි මටත් හිතුනෙ. නමුත් අපි තව විස්තර දැනගන්නකම් තීරණයක් ගන්න බැහැ. මට මේ දැන් ගැලෙක්සි වල ඉන්න කණ්ඩායමේ නම් ලැයිස්තුව ලැබුණා. මම ෆොලොයිඩ්ට කථා කලේ ඒකයි."

ස්මිත් පරිගණක මුද්‍රිත පිටපත ෆොලොයිඩ් ගේ අතට දෙන විටත්, එහි ඇත්තේ කුමක් දැයි ෆොලොයිඩ් ඉවෙන් මෙන් දැන සිටියේය.

"මගේ මුණුපුරා....."යි ෆොලොයිඩ් කීවේ හැඟීමකින් තොරවයි.

නමුත්, තම නම අනාගතයට ගෙන යා හැකි එකම තැනැත්තා ඔහු බව ෆොලොයිඩ්ට එවිටම මතක් විය.

## 21. ආයෝජන ගැටලු

කොතරම් අසුභ අනාවැකි පල කර තිබුණත් දකුණු අප්‍රිකානු විප්ලවය ලේ හැලීමකින් තොරව සිදුවුවක් ලෙස සැළකිය හැකියි. බොහෝ දේ ගැන වරද පටවා ඇති රූපවාහිණිය ට මෙහිදී ප්‍රංශසා කළ යුතුවේ. ලෝකයම තමා දෙස බලා සිටින බව දන්වා විට මිනිසුන් බොහෝ විට වගකීමෙන් යුතුව හැසිරෙන බව පෙනේ. තැනින් තැන යම් යම් අශෝභන දේ සිදුවිය හැකි වුවත් කැමරාවක් ඉදිරියේ

සමූලඝාතනයන් සිදු වන්නේ කලාතුරකිනි.

සිදුවන්නට යන දේ නොවැළැක්විය හැකි බව දැන ගත් බොහෝ ඇෆ්රිකානිස්වරු කල් ඇතුවම රටින් පිට වූහ. අලුත් පාලකයින් චෝදනා කල පරිදි, ඔවුන් ගියේ හිස් අතින් නොවේ. නිදහස් දිනය වන විට රටේ එක රන් අවුන්සයක් වත් නොතිබුණ අතර බොහෝ පතල් ක්‍රියා විරහිත කර තිබුණි. නමුත් ඉතා කෙටි කාලයක් තුළ සියල්ල යථා තත්වයට පත් කිරීමට නව රජය සමත් විය.

එක් පරම්පරාවක් තුළදී සිදුවූ රුසියන් විප්ලවයේ දී මෙන්, තම නැතිවූ වරප්‍රසාද නැවත ලබා ගැනීමට තැත් කල අය මෙහිද සිටි බැවින් පෙත්සම්, පෙළපාලි හා වැඩ වර්ජන වල කෙළවරක් නොවීය.

මෙම අරමුණ ඉටු කර ගැනීමට යොදා ගත්තේ දේශපාලනය පමණක් නොවේ. සාහිත්‍ය හා කලාව ද ඉතා සූක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනුණි. කෙසේ වෙතත් මෙම සටන් තුළින් ඉතා උසස් මට්ටමේ කෘතීන් ගණනාවක් බිහිවූ බව කවුරුත් අවිවාදයෙන් පිළිගත් කරුණකි. මේ අතරම පැරණි ක්‍රමයට ආපසු යා හැක්කේ හිංසාව තුළින් පමණක් බව විශ්වාස කළ අය ද වූහ.

නව සමාජයට සම්පූර්ණයෙන් හැඩ ගැසුණු අයත්, එයට කිසිසේත් එකඟ නොවූ අයත් අතර විවිධ අදහස් දැරූ දේශපාලන හා දේශපාලන නොවූ පක්ෂ හා කණ්ඩායම් ගණනාවක්ම දැකිය හැකි විය. මේ අතර ප්‍රධානතම මෙන්ම බලවත් හා පොහොසත්ම සංවිධානයක් වූයේ ඩර්බුන්ඩ් ආයතනයයි.

රටෙන් පිට කළ ධනයෙන් වැඩි කොටසක් පාලනය කළ එය, දැන් අන්තර් ජාතික පිළිගැනීමක් ඇති වැදගත් සංවිධානයක් බවට පත්වී තිබේ.

මෙම ආයතනයේ මුදල් වලින් බිලියන භාගයක් සුන්

අභ්‍යවකාශ සමාගමේ ආයෝජනය කොට තිබුණි. 2059 දී ඔවුන් තවත් බිලියන භාගයක් ආයෝජනය කිරීම නිසා ශ්‍රීමත් ලොරන්ස් ට තම වැඩ පිළිවෙළ වේගවත් කිරීමට හැකි වුයේය.

නමුත් සුන් අභ්‍යවකාශ සමාගමේ අලුත්ම කුලී සේවාවත්, ඩර්බුන්ඩ් ආයතනයත් අතර ඇති සම්බන්ධය සොයා ගැනීමට ඔහුගේ ඔත්තු සේවයටත් හැකි නොවීය. හැලී ධූම කේතුව අහහරු වෙතට ළං වෙමින් තිබූ බැවින් ශ්‍රීමත් ලොරන්ස්ගේ පූර්ණ අවධානය යොමු වී තිබුණේ යුනිවර්ස් අහස් ගත කිරීම ගැනය. එබැවින් අනිත් යානා වල එදිනෙදා ගමන් බිමන් ගැන සොයා බැලීමට ඔහුට කාලයක් නොතිබුණි.

ලන්ඩනයේ ලොඩ්ස් ආයතනය, ගැලෙක්සි යානයේ ගමන් මග පිළිබඳව ප්‍රශ්න කර තිබුණද එය පහසුවෙන් විසඳා ගන්නා ලදි. සෑම තැනකම වැදගත් පදවි වල ඔවුන්ට හිතවත් අය සිටීම නිසා මෙය පහසු වීම, රක්ෂණ සමාගමේ අවාසනාව විය. නමුත් අභ්‍යවකාශ නීතිඥයන් ට නම් එය රන් ආකරයක් වූ බව කිව යුතු නොවේ.

## 22. පිපිරෙන ද්‍රව්‍ය

සෑම දින කිහිපයකටම වරක් කිලෝමීටර මිලියන ගණනකින් ස්ථානය වෙනස් වන ගමනාන්තයක් දෙකක් අතර නාවික සේවාවක් පවත්වා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තකි. මේ නිසා නියමිත කාල සටහනකට අනුව කටයුතු කළ හැකි නොවේ. මේ නිසා අවශ්‍ය ආකාරයට සූර්ය ග්‍රහ මණ්ඩලය සකස් වන තුරු සමහර විට සති ගණන් බලා සිටිය යුතු විය.

වාසනාවකට මෙන් මෙම කාල පරිච්ඡේදයන් මොනවාද යන්න අවුරුදු ගණනකට කලින් දැනගත හැකි බැවින් යානා අලුත්වැඩියා කිරීම හා පිරිසිදු කිරීම වැනි කටයුතු සඳහා මෙවැනි කාල පරිච්ඡේදයන් යොදා ගත හැකි

වේ. ගැනිමිඩ්හි ගත කිරීමට සිදුවී ඇති තුන් මාසයක නිවාඩුව, බ්‍රහස්පති ගේ චන්ද්‍රිකා පද්ධති ගවේෂණය කිරීමට යොදා ගත හැකි බව දැන ගැනීම, කපිතාන් එරික් ලැප්ලේස් ගේ සතුටට හේතු වූ බව කිව යුතු නොවේ. ග්‍රහලෝක විද්‍යා පදනමට හදිසියේ ලැබුණු ආධාර මුදලකින් මෙම චාරිකාවට මුදල් සැපයුණි. මෙහි ඇති කුඩා චන්ද්‍රයන් මෙතෙක් නියම සමීක්ෂණයකට භාජනය වී තිබුණේ නැත.

මේ පිළිබඳව දැනගත් වහාම රොල්ෆ් වැන්ඩර්බර්ග්, සුන් අභ්‍යවකාශ ආයතනයෙන් ඒ පිළිබඳව විමසා බැලුවේය.

"ඔව් අපි මුලින් අයෝ චන්ද්‍රයා වෙතට ගිහින් පස්සේ යුරෝපා උඩින් යෑමට බලාපොරොත්තු වෙනවා."

"උඩින් යනවා විතරද? කොච්චර කිට්ටුවට යන්න බලාපොරොත්තු වෙනවාද?"

"පොඩ්ඩක් ඉන්න. පුදුමයි. ඒ විස්තර මේකේ දීල නැහැ. නමුත් මම හිතන්නේ නැහැ, තහනම් ප්‍රදේශය ඇතුළට යයි කියලා."

"ඒ කියන්නේ කිලෝමීටර දස දහසකට ඈතින්, මම කැමතියි මේ ගමනට එක් වෙන්න, කණ්ඩායමේ භූ විද්‍යාඥයා හැටියට මගේ විස්තර එවන්නද?"

"ඕනේ නැහැ ආචාර්ය වැන්ඩර්බර්ග්. දැනටමත් ඔබ තෝරා ගෙනයි තියෙන්නේ."

යමක් සිදුවූවාට පසු ඒ පිළිබඳ විවිධ අර්ථකථන දීම ඉතා පහසු කටයුත්තකි. ඇත්තෙන්ම මෙම ගමනේ පුදුම සිද්ධීන් කීපයක්ම වූ බව කපිතාන් ලැප්ලේස්ට පසුව සිහිවිය. කණ්ඩායමේ සාමාජිකයන් දෙදෙනෙක්ම හදිසියේ රෝගාතුර වීම පළමු වැන්නයි. මේ නිසා ඒ වෙනුවට එවන ලද දෙදෙනා පිළිබඳව වැඩිදුර සොයා බැලීමට කපිතාන්ට කාලයක් තිබුණේ

නැත. (සොයා බැලුවත් ඔවුන් ඉතා සුදුස්සන් ලෙස තීරණය කෙරෙනු නොඅනුමානයි.)

ඊළඟ ප්‍රශ්නය පැන නැගුනේ ගෙන යන බඩු බාහිරාදිය සම්බන්ධයෙනි. යානය තුළ ගෙන යන ඕනෑම දෙයක් පරික්ෂා කිරීමේ අයිතිය කපිතාන් සතු වුවද, සෑම දෙයක්ම පරීක්ෂා කිරීම කළ හැකි දෙයක් නොවේ. නමුත් දෙවැනි නිලධාරියා වූ ක්‍රිස් ෆොලොයිඩ් ඔහුගේ සැකය ගැන දැන්වූ විට, තත්වය බරපතල බව කපිතාන්ගේ අදහස විය.

"අයිතම 2/456, ලැයිස්තුවේ සඳහන් වන්නේ විද්‍යාත්මක උපකරණ හැටියටයි. නමුත් තියෙන්නේ පුපුරණ ද්‍රව්‍ය."

"මොනවා?"

"ඔව් පුපුරණ ද්‍රව්‍ය තමයි."

"මම ඔබේ වචනය පිළිගන්නවා ෆොලොයිඩ්. ඔබ මේ ඇහුරුම පරික්ෂා කළාද?"

"නැහැ. ඒක මීටර පහක් පමණ දිග මුද්‍රා තැබූ පෙට්ටියක්. ඒකෙත් අනිත් පෙට්ටි වල වගේම 'බිඳෙන සුළුයි-පරිස්සමින්' කියල ලියල තියෙනවා."

තම දෙවැනි නිලධාරියා ඉතා දක්ෂයෙක් බව කපිතාන් ගේ හැඟීමයි. ඔහු මෙතෙක් කිසිම දවසක ඔහුගේ සුප්‍රසිද්ධ සීයා ගැන කථා කර නැත. කෙසේ වෙතත් රසායනිකයක් නිසා මේ ප්‍රතිඵල ලැබුණේද යන සැකයද කපිතාන්ගේ සිතෙන් ඉවත් වූයේ නැත.

"ආචාර්ය ඇන්ඩර්සන්ට මා හමුවන්නැයි කියන්න. මේක ගැන කාටවත් කියන්න එපා."

"බොහොම හොඳයි." කී ක්‍රිස් ෆොලොයිඩ් කපිතාන්ට ආචාර කොට කාමරයෙන් පිට විය.

විද්‍යාත්මක කණ්ඩායමේ නායක ඇන්ඩර්සන් ශූන්‍ය ගුරුත්වයට තවම පුරුදු වී නැති බැවින් ඔහු කපිතාන් ගේ කුටියට ඇතුළු වූයේ ඉතා අපහසුවෙනි.

"නැහැ, නැහැ පුපුරණ ද්‍රව්‍ය තියෙන්න විදිහක් නැහැ." කියමින් ඇන්ඩර්සන් එම අදහස සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළේය.

"කෝ බලන්න ලැයිස්තුව"

"ආ මේක තියෙන්නේ මාර්ක් පහේ පෙනිට්‍රොමීටර තුනක්. කිසිම ප්‍රශ්නයක් නැහැ."

"ඒ මොකක්ද?"

"ග්‍රහ ලෝක නියැදි ලබාගන්නා සාමාන්‍ය උපකරණ, මේක උඩ ඉඳලා දැම්මාම ඝන පාෂාණයක උනත් මීටර දහයක් දිග නියැදියක් ලබා ගන්න පුළුවන්. එහි සම්පූර්ණ රසායනික විශ්ලේෂණයක් අපට ලැබෙනවා. අයෝ වැනි ලෝකයක් සමීක්ෂණය කරන්න තියෙන හොඳම ක්‍රමය මේකයි."

"ආචාර්ය ඇන්ඩර්සන්, ඔබ ඉතා හොඳ භූ විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්. නමුත් අභ්‍යවකාශ විද්‍යාව ගැන නම් දන්න බවක් පේන්නෙ නැහැ. අභ්‍යවකාශ කක්ෂයක ඉඳගෙන පහළ තියෙන ලෝකයකට නිකම්ම උපකරණ දාන්න බැහැ."

ආචාර්ය ඇන්ඩර්සන් එතරම් මෝඩයෙක් නොවන බව ඔහුගේ ඊළඟ පිළිතුරෙන් පැහැදිලි විය. "මේකෙ පහළට යවන රොකට් උපකරණයක් තියෙන බව ඔබට දැනුම් දිය යුතුව තිබුණා."

"ඒක තමයි ඝන ඉන්ධන රොකට් වර්ග කරල තියෙන්නෙ අනතුරුදායක භාණ්ඩ විදිහටයි. අපි මේ බව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න ඕනෙ. අනිත් අතට ආරක්ෂණ ක්‍රම ප්‍රමාණවත් බවට ඔබ සහතික වෙන්නත් ඕනේ."

තවත් තහනම් ද්‍රව්‍යයක් වූ ෆ්ලෝරීන් බෝතල දෙකක් ද මේ භාණ්ඩ අතර ඇති බව ඇන්ඩර්සන් වාර්තා කළේ තවත් පැය දෙකකට පසුවයි. රොකට් මෙන් එයද ඔවුන්ගේ පරීක්ෂණ සඳහා නැතිවම බැරි ද්‍රව්‍යයක් ලෙස නම් කරන ලදි. කෙසේ වෙතත් අවශ්‍ය සියලුම ආරක්ෂිත පියවර ගෙන ඇති බව සැක හැර දැනගත් කපිතාන් වරයා ආචාර්ය ඇන්ඩර්සන් ගේ ප්‍රකාශය සත්‍යයක් ලෙස පිළිගත්තේය. එහෙත් තමා නොදන්නා රහසක් මෙහි ඇතැයි යන හැඟීමද ඔහුගේ සිතෙන් ඉවත් වුයේ නැත.